# නූතන සිංහල කෙටි කවි විචාරයෙහිලා ක්ෂණික අන්තර්දෘෂ්ටි (Epiphany) සංකල්පයෙහි ඇති වැදගත්කම

# The significance of epiphany in criticizing Modern Sinhalese short poems

අපරැක්කේ සිරිසුධම්ම හිමි

සිංහල අධ්‍යයනාංශය,

රුහුණ විශ්වවිද්‍යාලය.

sudhaaparekke@gmail.com

**සංක්ෂේපය**

*සංක්ෂිප්ත කවි, සැකෙවි කවි, සාර සංක්ෂිප්ත කවි හා කෙටි කවි යන පර්යාය නාමවලින් යුත් මෙම කාව්‍ය ශානරය නූතන සිංහල කවියේ වඩාත් කතාබහට ලක් වූවකි. කෙටි බව හා ඉතා අවම වචන සංඛ්‍යාවක් ස්වභාව කරගත් මෙම කාව්‍ය ශානරය සිංහල පාඨකයා හයිකු කවි හා සාම්‍යත්වයෙහිලා විචාරයට නැඹුරු වූවත් කෙටි කාව්‍ය ආකෘතිය සිංහල කාව්‍ය සාහිත්‍යයෙහි සමාරම්භයෙහි පටන් සාක්ෂ්‍ය ඇතුළත් කාව්‍ය ආකෘතියක් බවද මෙහිදී සඳහන් කළ යුතුය. එහෙත් සිව්පද, දෙපද, ගී වැනි කාව්‍ය ආකෘති හා දීර්ඝ කාව්‍ය නිර්මාණයකින් රසයක් බලාපොරොත්තු වන ඇතැම් සිංහල කවියෝ, විචාරකයෝ හා පඨකයෝ මෙම කෙටි කවි හුදු කෙටි බවම උරුම කරගත් ශබ්දාර්ථය හීන කාව්‍ය ප්‍රභේදයක් ලෙස විවේචනය කරති. තවද කෙටි කවි මතුපිටින් කියවන බොහෝ අය එහි ඇත්තේ හුදු ස්වභාව කථනයක් යැයි සිතා වැරදි වැටහීම් ඇති කර ගනිති; අන්තර්ගතය හා බැඳුණු ඇතුළු එළි දිගේලි නොකරති. එහෙත් චිත්තරූපික බව, අනවශ්‍ය අලංකරණවලින් ඈත් වීම, වචනයේ සීමා සහිත බව, විවිධ අර්ථ ව්‍යූහ හා පාඨක අද්දැකීම් යටතේ කාව්‍යාත්මයට සමීප වීම, අන්තර්දෘෂ්ටි කියවීම, අප්‍රකාශිත අර්ථ ව්‍යූහ ලිහා බැලීම, දාර්ශනික චින්තා අන්තර්ගතය ආදි කෙටි කවියේ ස්වභාව හා විශේෂතා වටහා ගැනීමට පාඨකයා සමත් විය යුතුය. කෙටි කවියේ ඇති විශේෂත්වය වටහාගැනීමට එපිෆනි ඃැචසචය්බහ* සංකල්පය යොදා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණයි. මෙම එපිෆනි සංකල්පය ක්ෂණික අන්තර්දෘෂ්ටිය වශයෙන් සිංහලට පරිවර්තනය කළ හැකිය. ක්ෂණික අන්තර් දෘෂ්ටිය යනු තර්ක බුද්ධියේ සීමා අතික්‍රමණය කරමින්, දෘෂ්ටිවාදවලින් ඉවත් වෙමින් ස්වාධීනව සාහිත්‍ය භාවිත කරන්නේ කෙසේද යන කාරණයේදී වැදගත් වන සංකල්පයකි. අන්තර්දෘෂ්ටියෙන් ලබා දෙන්නේ පාඨකයාට සාහිත්‍ය ශානරය හා සමීප විය හැකි බුද්ධිමය ආලෝකයකි. එම ක්ෂණික බුද්ධිමය ආලෝකය පාඨකයාට සමාජය, ජීවිතය දෙසද දෘෂ්ටිගතයන්ගෙන් මිදී නිදහස්ව බැලීමට උගන්වයි. ඒ අනුව කෙටි කවි විචාරයට එපිෆනි සංකල්පය යොදාගත හැක්කේ කෙසේද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි. ඒ සඳහා ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් 2010 වර්ෂයෙන් පසුව පළ වූ කෙටි කාව්‍ය සංග්‍රහ 10කින් තෝරාගත් කාව්‍ය නිර්මාණ යොදාගනු ලැබේ. කාව්‍ය විචාරයෙහි කෙටි කවියේ උපයෝගීතාව සම්බන්ධයෙන් පවතින විචාරාත්මක කතිකාව පුළුල් කිරීම මෙම පර්යේෂණයේ වැදගත්කමයි.*

ප්‍රමුඛ පද: *අන්තර්දෘෂ්ටිය (Epiphany), කාව්‍ය විචාරය, කෙටි කවිය, හයිකු කවිය, බුද්ධිමය ආලෝකය*

## Abstract

Short poem, also locally called *Sækavi kavi, Sāra saṃṣipta kavi,* is one of the most discussed genres in modern Sinhalese poetry. Even though it is often compared with Haiku because of linguistic economy, there is enough evidence to demonstrate that Sinhalese poetry tradition was rich enough to produce such a poetic genre from the beginning itself. It is, however, unfortunate to see some scholars who hold the aesthetic values of quatrain, couplet etc. high regards tend to criticize short poem stating it is nothing but a poetic genre with a linguistic economy and does not have high semantic values. Moreover, some intellectuals called it merely a description of nature without considering the deep semantic aspects and structural dimensions. Nevertheless, a number of studies show that short poems are not just a description of nature, they are characterized by subsequent notable features; signifier and signified, less rhetorical devices, ability read through various semantic dimensions and reader's experiences, epiphanic nature, encoded semantic structures, philosophical background. To be able to grasp the overall semantic background of a short poem, it is pivotal to focus on these features. This paper attempts to provide a more detailed investigation regarding the significance of short poems through epiphany. Epiphany is a concept that provides a sudden insight or realization that changes the reader's understanding. This paves the way for a reader to be independent in understanding a poem and comprehends society, and life without being an ideologist. The research seeks to address the following problem; how to practice epiphany to read or criticize short poems. Thus, it set the stage to carry out a discussion about the utilization of short poems as a sub-genre in modern Sinhalese poetry. Being qualitative research, short poems published after 2010 will be made used as primary sources.


**Keywords: Epiphany, Short poems, Literary criticism, Haiku, Insight**

## 1. හැඳින්වීම

සිංහල කවියේ කෙටි ආකෘතික භාවිතය සම්බන්ධයෙන් ක්‍රි.පූ. 3වන සියවසයේ පටන් සාක්ෂ්‍ය පවතින බවට විවිධ කතිකා පැවතියත් හයිකුමය ස්වභාවයෙන් යුත් සිංහල කෙටි කවිය පිළිබඳ පාඨකයා සාවධාන වන්නේ නූතන සිංහල කවීන්ගේ නිර්මාණ දායකත්වයත් සමගින්ය. ඒ සඳහා ආරියවංශ රණවීරගේ **මිණි පැමිණි, විසිරි මිණි** වැනි හයිකු කාව්‍ය පරිවර්තන කෘතිවලින් ලද පාඨක අද්දැකීම ප්‍රධාන සාධකයක් විය. ඒ අනුව වර්තමානයේ පාඨකයා අතර ප්‍රසිද්ධ කාව්‍ය ශානරයක් බවට කෙටි කවිය පත්ව ඇත. එහෙත් කෙටි කවි මතුපිටින් කියවන බොහෝ අය එහි ඇත්තේ හුදු ස්වභාව කථනයක් යැයි සිතා වැරදි නිගමනවලට එළඹ සිටිති. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ කෙටි කවියේ ඇති කාව්‍යාත්මක වටිනාකම එපිෆනි (Epiphany) හෙවත් ක්ෂණික අන්තර් දෘෂ්ටිය නමැති න්‍යායාත්මක ප්‍රවේශය යටතේ සාකච්ඡා කිරීමයි. ක්ෂණික අන්තර් දෘෂ්ටිය යනු තර්ක බුද්ධියේ සීමා අතික්‍රමණය වන ලෙස කලාව භාවිත කරන්නේ කෙසේද යන කාරණයේදී වැදගත් වන සංකල්පයකි (අමරකීර්ති, 2010: 67). කිසියම් සාහිත්‍ය කෘතියක් කියවීමේදී හා කලා කෘතියක් වින්දනයේදී ඉන් ක්ෂණිකව පැන නැගෙන බුද්ධිමය ආලෝකය හෙවත් ක්ෂණික අන්තර් දෘෂ්ටිය එපිෆනි වශයෙන් හැඳින්විය හැකිය. කවියක ඇතුළත් සාහිත්‍යික ආනන්දය සොයා යෑමට සහ සෞන්දර්යාත්මකව එහි සඳහන් විදර්ශනාත්මක කණිකා හැඳින ගැනීමට එපිෆනි නමැති ක්ෂණික අන්තර්දෘෂ්ටිය මහත් රුකුලකි. එකී සාහිත්‍යික අන්තර්දෘෂ්ටිය මිනිසාට ලෝකය පිළිබඳ නිදහසේ සිතීමට ඉඩ ලබාදෙන බව චාල්ස් හැලිසි පවසයි (Hallisey, 2015, ix). ඒ අනුව කෙටි කවි විචාරයට එපිෆනි සංකල්පය යොදාගත හැක්කේ කෙසේද? ඉන් කෙටි කවියට ලැබෙන ආලෝකය කවරේද? යන්න පිළිබඳ සොයා බැලීම මෙහි පර්යේෂණ ගැටලුවයි. කෙටි කවිවල ඇතුළත් එම දාර්ශනික එළි විවරණය කර කෙටි කවියේ සුවිශේෂ බව ඉස්මතු කර දැක්වීම මෙහි පර්යේෂණ අරමුණයි.

## 2. සාහිත්‍ය විමර්ශනය

මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් යොදාගනු ලබන්නේ 2010 වසරෙන් පසුව පළ වූ කාව්‍ය සංග්‍රහවල ඇතුළත් කෙටි කාව්‍ය නිර්මාණයි. ආරියවංශ රණවීර, නන්දන වීරසිංහ, ලක්ශාන්ත අතුකෝරල, වසන්ත ප්‍රියංකර නිවුන්හැල්ල, මාලන් බණ්ඩාර කපුවත්ත, මාලතී කල්පනා ඇම්බ්‍රෝස්, මංජුල වෙඩිවර්ධන, සුනිල් විජේසිරිවර්ධන, තැන්නේ ඤාණානන්ද හිමි, කුසල් ධනංජය කුරුවිට වැනි කවි කිවිඳියන්ගේ කෙටි කාව්‍ය සංග්‍රහවල හා වෙනත් කාව්‍ය සංග්‍රහවල ඇතුළත් නිර්මාණ මෙම පර්යේෂණය සඳහා යොදා ගැනේ. ක්ෂණික අන්තර් දෘෂ්ටිය (Epiphany) නමැති සංකල්පය කෙටි කවිවල සෞන්දර්ය අධ්‍යයනය හා දාර්ශනික එළි විනිශ්චයෙහිලා යොදාගැනෙන අතර එය පැහැදිලි කිරීම සඳහා හාර්වඩ් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය චාර්ල්ස් හැලිසි විසින් සම්පාදනය කරන ලද

**Therigatha** (Poems of the First Buddhist Women) කෘතියේ පෙරවදනත්, චාල්ස් ටේලර් විසින් රචනා කරන ලද Sources of the Self the Making of Modern Identity කෘතියේ සඳහන් ලිපියත්, ලියනගේ අමරකීර්ති විසින් රචනා කරන ලද **පහන සහ කැඩපත** කෘතියත් යොදාගැනේ. එහෙත් මෙම කිසිදු කෘතියක මෙම එපිෆනි සංකල්පය හා කෙටි කාව්‍ය විචාරය හා සම්බන්ධ පූර්ණ හා විශ්ලේෂණාත්මක පර්යේෂණයක් සිදු කර නොමැත. එම පර්යේෂණ හිඩැස පූර්ණ කිරීමට යම් සාධනීය ප්‍රයත්නයක් දැරීම මෙහි අභිලාෂයයි.

## 3. පර්යේෂණයේ අරමුණු

නූතන සිංහල කවියේ සෞන්දර්මය පක්ෂය හා බුද්ධිමය, දාර්ශනික ප්‍රහර්ෂ පඨනයෙහිලා න්‍යායාත්මක ප්‍රවේශයන්හි වටිනාකම හඳුනාගැනීම

කෙටි කවියේ ඇති විශේෂත්වය වටහාගැනීමට එපිෆනි (Epiphany) සංකල්පය යොදා ගැනීම

## 4. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා පුස්තකාලය හා අන්තර්ජාලය පරිහරණය හා විෂය ප්‍රාමාණිකයන් සමග කරනු ලබන සාකච්ඡා ඔස්සේ දත්ත රැස් කිරීම සිදු වේ. පර්යේෂණය ගුණාත්මක ක්‍රමවේදය යටතේ විශ්ලේෂණය කෙරෙන අතර නූතන විචාර සංකල්ප කිහිපයක ආශ්‍රයද ඒ සඳහා භාවිත කෙරේ. ඒ අනුව මෙම පර්යේෂණයේ න්‍යායික සීමාව වන්නේ ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදයයි. 2008 වසරෙන් පසුව පළ වූ ආරියවංශ රණවීර (2017), නන්දන වීරසිංහ (2014), ලක්ශාන්ත අතුකෝරල (2008), වසන්ත ප්‍රියංකර නිවුන්හැල්ල (2009), මාලන් බණ්ඩාර කපුවත්ත (2015), මාලතී කල්පනා ඇම්බ්‍රෝස් (2018), යේශා ෆර්නැන්ඩු (2019), මංජුල වෙඩිවර්ධන (2020), සුනිල් විජේසිරිවර්ධන (2017), තැන්නේ ඤාණානන්ද හිමි (2014), කුසල් ධනංජය කුරුවිට (2020) වැනි කවි කිවිඳියන්ගේ කෙටි කාව්‍ය සංග්‍රහවල පළ වූ කෙටි කවි මෙම පර්යේෂණයේ දත්ත සීමාවයි. එම කෙටි කාව්‍ය පඨනයේදී එපිෆනි සංකල්පයේ උපයෝගිතාව මෙම පර්යේෂණයේ ක්ෂේත්‍ර සීමාවයි.

## 5. විශ්ලේෂණය

### 5.1. නූතන සිංහල කෙටි කවිය

කාර්මික විප්ලවය හා ප්‍රංශ විප්ලවය වැනි සාධක සාහිත්‍ය කලා ශානර පිළිබඳ විවිධ අර්ථකථන බිහිවීමටද මූලික බලපෑමක් සිදු කළේය. එහිදී නූතනවාදය, පශ්චාත් නූතනවාදය ආදී විවිධ විචාර න්‍යාය හේතු කරගෙන සාහිත්‍ය කලා නිර්මාණ රචනය එහි ආකෘතිය හා ව්‍යූහය මෙන්ම ඉන් ප්‍රකාශිත සෞන්දර්ය පිළිබඳ විනිශ්චයද විවිධ දෘෂ්ටිකෝණ ඔස්සේ

විචල්‍යතාවන්ට ලක්විය (දිසානායක, 2010: 136, 137). ලාංකේය පද්‍ය සම්ප්‍රදායේ නූතනවාදී එළඹුම කෙරෙහි මූලික සන්ධිස්ථානය ලෙස සැලකෙන්නේ නිසඳැස් කවියේ බිහිවීමයි. නූතන සිංහල කවියේ නව්‍ය ප්‍රවණතා හා නව්‍ය ආකෘතික සංලක්ෂණ කෙරෙහි අවධානය යොමු කිරීමේදී දැකගත හැකි මූලික කාව්‍ය උපශානරයක් ලෙස සිංහල කෙටි කවි හැඳින්විය හැකිය.

ලෝකයේ විවිධ කාව්‍ය ශානර අතර කෙටි කවිය සම්බන්ධයෙන් විවිධාකාරයේ අද්දැකීම් පැවතියද ජපන් හයිකු කවිය ලෝකය හඳුනාගැනීමත් සමග කවියා හයිකුමය තාක්ෂණයෙන් කෙටි කවි රචනා කිරීමට පෙළඹිණි (සිරිසුධම්ම හිමි, 2019: 311). ලෝක සාහිත්‍යයේ බොහෝ කවීන් විසින් ඒ සඳහා හයිකු කාව්‍ය ආකෘතියේ හා ව්‍යූහයේ සුසමාදර්ශය තම කෙටි කාව්‍ය රචනය සඳහා භාවිත කරන ලදි. සිංහල කාව්‍ය සම්ප්‍රදායේ කෙටි කාව්‍ය ආකෘතිය සම්බන්ධ අද්දැකීම් ක්‍රි.පූ. 3වන සියවසයේ පටන් සාක්ෂ්‍ය පවතින බවට විවිධ කතිකා පවතී. ඒ ක්‍රි.පූ. 3වන සියවසයේ හමුවන කොස්ගමකන්ද ශිලාලේඛනයේ කාව්‍යමය ලක්ෂණ පවතින බවට 1945දී මහාචාර්ය පරණවිතාන කළ හෙළිදරව්වත් සමගිනි (Paranavithana, 1945: 62). මීට අමතරව ලාංකේය සම්භාව්‍ය සාහිත්‍යයේ හමුවන **මුවදෙව්දාවත**, **සසදාවත**, **කව්සිළුමිණ**, **කාව්‍යශේඛරය** වැනි කෘතිවල එක් ආඛ්‍යානයක් සම්පූර්ණ කාව්‍ය කෘතිය ඇතුළත දක්නට ලැබුණද ඒ සඳහා භාවිත කාව්‍ය ආකෘති බහුතරයක් ප්‍රමාණයෙන් ඉතා කුඩා ගී හා සිව්පද ආකෘතිය. එමෙන්ම සීගිරි ගීවලින් හමුවන සාක්ෂ්‍ය මගින්ද අපට හමුවන බහුතරයක් ගී ප්‍රමාණයෙන් ඉතා කුඩා ඒවාය. මෙවැනි සාධක සූක්ෂ්මව විමසීමේදී ලාංකේය පද්‍ය සම්ප්‍රදායේ කුඩා ආකෘතියෙන් යුත් කාව්‍ය භාවිතය බොහෝ කාලයක සිට පවතින්නකි. එම පර්යේෂණ දත්ත අනුව යමින් නූතන සිංහල කවීහු ලාංකේය කෙටි කවියේ ඉතිහාසය බොහෝ පැරණි බවට විවිධ අර්ථකථන ඉදිරිපත් කළහ. එහෙත් හයිකුමය ස්වභාවයෙන් යුත් සිංහල කෙටි කවිය පිළිබඳ පාඨකයා සාවධාන වන්නේ නූතන සිංහල කවීන්ගේ නිර්මාණ දායකත්වයත් සමගින්ය. ඒ සඳහා ආරියවංශ රණවීරගේ **මිණි පැමිණි** (2000), **විසිරි මිණි** (1985) වැනි හයිකු කාව්‍ය පරිවර්තන කෘතිවලින් ලද පාඨක අද්දැකීම ප්‍රධාන සාධකයක් විය. ඒ අනුව සිංහල කෙටි කවිය යනු සජාතීය, නොකිළිටි අප ජන සමාජයෙන්ම උත්පාදනය වූ කාව්‍ය සම්ප්‍රදායක් ලෙස අර්ථකථනය කිරීමට වඩා එය සම්භාව්‍ය සාහිත්‍යයේද ලෝක සාහිත්‍යයේ හමුවන විවිධ කාව්‍ය ශානර අන්තර්පෝෂණය වීමෙන් බිහි වූවක් ලෙස අර්ථකථනය කිරීම වඩාත් යෝග්‍යය. උදාහරණයක් ලෙස නූතන සිංහල කෙටි කවි රචනා කරන සිංහල කවීන්ට චීන කවිය, ජපන් හයිකු කවිය, ග්‍රීක කවිය, දකුණු ඉන්දියානු චාටු කාව්‍ය, සම්භාව්‍ය සිංහල කාව්‍ය සම්ප්‍රදාය, බෞද්ධ ගාථා ධර්ම, ඉංග්‍රීසි කවිය ආදී විවිධ කාව්‍ය ශානර හා උපශානරවල අඩු වැඩි ආභාසය හා අන්තර් පෝෂණය බලපාන්නට ඇතැයි සඳහන් කිරීම වඩාත් උචිතය.

මෙම කාව්‍ය ප්‍රවණතාව සඳහා නූතනයේ සංක්ෂිප්ත, සැකෙවි, සාර සංක්ෂිප්ත කවි යන විවිධ නම් භාවිත වේ. එහෙත් අප විසින් මේ සඳහා භාවිත කරනු ලබන්නේ 'කෙටි කවිය' යන නාමයයි. ඊට ප්‍රධාන හේතුව වන්නේ 'කෙටි' හා 'සංක්ෂිප්ත' යන පදවල මතුපිට අර්ථයෙහි කිසියම් සමාන අර්ථයක් ප්‍රතීයමාන වුවත් සංකල්පීය වශයෙන් සංකීර්ණ හා වෙනස් අර්ථ එම පද දෙකෙහි අන්තර්ගත බැවිනි. මේ පිළිබඳ අදහස් දක්වන මහාචාර්ය ලියනගේ අමරකීර්ති පවසන්නේද කවියක සංක්ෂිප්ත බව සෞන්දර්ය ප්‍රභේදයක් මිස කවියෙහි ආකෘතිය හා භෞතික ස්වභාවය මනින මිම්මක් නොවන බවයි (අමරකීර්ති, 2016: 129). සංක්ෂිප්තතාව යන්න ඕනෑම සාහිත්‍ය කාලා නිර්මාණයක මෙන්ම කෙටි කවියකද තිබිය හැකි සෞන්දර්ය ලක්ෂණයකි. එබැවින් මෙම කාව්‍ය ප්‍රවණතාව සඳහා භාවිත කළ හැකි වඩාත් යෝග්‍යම පදය 'කෙටි කවිය' බව මෙහිදී සඳහන් කළ යුතුය (සිරිසුධම්ම හිමි, 2019: 313). මෙම කාව්‍ය ප්‍රවණතාව පිළිබඳ රුචිකත්වයෙන් කෙටි කවි රචනා කරන නූතන සිංහල කවීන් බොහොමයක් සමකාලීන සිංහල කවිය අධ්‍යයනය කිරීමේදී දැකගත හැකිය. එම කාව්‍ය ප්‍රවණතාවේ සෞන්දර්යමය අගය, බුද්ධිමය ප්‍රහර්ෂය හා දාර්ශනික අර්ථ ව්‍යූහ පඨනයට පහසු වන ලෙස එපිෆනි (Epiphany) සංකල්පය යොදාගැනීම මෙහිදී සිදු කෙරෙනු ලැබේ. එපිෆනි (Epiphany) යන ඉංග්‍රීසි වචනය සඳහා 'ක්ෂණික අන්තර්දෘෂ්ටිය' යන සිංහල වචනය මෙහිදී භාවිත කෙරේ.

### 5.2. ක්ෂණික අන්තර්දෘෂ්ටිය හෙවත් එපිෆනි (Epiphany) සංකල්පය

සමාජ, දේශපාලන, ආගම් හා සංස්කෘති ව්‍යූහ මගින් මිනිසාට පවරා ඇති විවිධ දෘෂ්ටිවාද හා දෘෂ්ටිකෝණ විනිවිද යන දැක්ම ක්ෂණික අන්තර්දෘෂ්ටිය යනුවෙන් කෙටියෙන් හැඳින්විය හැකිය. එය සියලු සමාජ සම්මත දෘෂ්ටිවාදවලට ඉහළින් හා වඩාත් සාධරණව සමාජය දෙස බැලීමට සැපයෙන ක්ෂණික බුද්ධිමය අන්තර්දෘෂ්ටියකි; මිනිසාගේ සාම්ප්‍රදායික දැක්ම නිරවුල් කරන ක්ෂණික බුද්ධිමය ආලෝකයකි. එපිෆනි යන වචනය මූලිකව භාවිත වී ඇත්තේ ආගමික වාක්කෝෂයේ හෙවත් ක්‍රිස්තු දේව ධර්ම ඉගැන්වීම්වලය. මූලිකව බයිබලයේ ක්‍රිස්තු දේව උප්පත්තිය හා සම්බන්ධ යම් යම් අවස්ථා පැහැලිදි කිරීම සඳහා මෙම එපිෆනි (Epiphany) නමැති වචනය භාවිත කර ඇත. එපිෆනි යන වචනය විශේෂ අර්ථ ප්‍රස්තරයක් යටතේ හමුවන ප්‍රධාන අවස්ථාව එයයි. මෙම එපිෆනි (Epiphany) වචනය සඳහා මහාචාර්ය සුචරිත ගම්ලත් **ඉංගිරිසි-සිංහල මහා ශබ්දකෝෂයේ** අර්ථ 05ක් දක්වයි. එහි පළමු වැන්න නම් ක්‍රිස්තුන් වහන්සේ ආවිර්භාවය; ප්‍රාදූර්භාවය; මහාපුරුෂාවතරණය; යන රජ තුන් කට්ටුවට පෙනී සිටීම යන්නයි. දෙවැන්න නම් රජ තුන් කට්ටුවේ මංගල්‍යය; රජුන්ට ප්‍රත්‍යක්ෂ වීමේ මංගල්‍යය; දෘෂ්ට මංගල්‍යය; ජනවාරි 06 වෙනිදා යන්නයි. තෙවැන්න නම් බයිබල්ගත ක්‍රිස්තුන් වහන්සේ යන්නයි. සිව්වැන්න නම් දෙවියෙකු පෙනී සිටීම යන්නයි. පස්වැන්න ක්ෂණික හා මහා අනාවරණය යන්නයි (ගම්ලත්, 2009, 787). මෙම වචනය

මුල්කාලයේ ආගමික අර්ථයෙන් භාවිත වුවද පසුකාලීනව සාහිත්‍ය කලා නිර්මාණවලින් ගොඩනැගෙන අර්ථමය කණිකා හා දාර්ශනික ඉංගිත හා ප්‍රකාශන පථනයෙහිලා භාවිත විය. එය ආගමික පරිසරයෙන් වියුක්තව සාකච්ඡා කිරීමේ මූලික සංකල්පය පිළිබඳ හැරී ලෙවින් (Harry Levin) අදහසක් පළ කළද සාහිත්‍ය කලා කියවීමේදී එපිෆනි යන්න කියවීම් ක්‍රමයක් ලෙස භාවිත කරන ලද්දේ ජේම්ස් ජොයිස් (James Joyce -1898–1902* විසිනි. ඒ අනුව මුල්කාලයේ ආගමික පරිසරයේ යෙදුණු මෙම එපිෆනි යන වචනය පසුකාලීනව සාහිත්‍ය කියවීම සඳහා භාවිත කරන ලදි. එසේම ඔවුහු මෙම එපිෆනි යන වචනය ප්ලේටෝගේ හා ඇරිස්ටෝටල්ගේ දාර්ශනික අදහස් ඇසුරෙන් බිහි වන්නට ඇතැයි ද අදහස් පළ කරති (Bowen, 1981:103,104).

ජේම්ස් ජොයිස් හා හැරී ලැවින් සහ වෙනත් නිර්වචන ආශ්‍රයෙන් එපිෆනි යන්න අර්ථ දක්වා ඇත්තේ කිසියම් සිදුවීමක් හෝ අද්දැකීමක් පිළිබඳ එකවර වටහා ගැනීමක්, ක්ෂණික අන්තර්දෘෂ්ටියක්, ක්ෂණික පහළවීමක් යනුවෙනි (sudden realization, manifestation, insight, Enlightenment). ඒ අනුව එපිෆනි යනු එකවර ඇතිවන බුද්ධිමය ප්‍රභාවක් හා සමාන දෙයකි. ආකිමිඩිස් දිය නාමින් සිටියදී 'යුරේකා' (මම එය සොයාගත්තා) යැයි කෑගසමින් දිව ගිය සිදුවීම, ඇයිසැක් නිව්ටන් එකවර ඇපල් ගෙඩියක් හිස මත වැටීමෙන් ගුරුත්වාකර්ෂණය පිළිබඳ යම් සංජානනයක් ලැබූ සිදුවීම ඉතා ප්‍රසිද්ධ සංසිද්ධිය. මේ සිදුවීම් දෙකෙහිම දක්නට ලැබෙන්නේ එකවර ඇති වූ බුද්ධිමය ප්‍රභාවක ප්‍රහර්ෂයයි. එලෙස අපව වෙනස් කරවන සුලු තියුණු ක්ෂණික බුද්ධිමය ප්‍රභාවයන් හා අන්තර්දෘෂ්ටි පෞද්ගලික අද්දැකීම් ආශ්‍රයෙන් සැමටම පවතින්නකි. ඇතැම්විට නරකක් අයපහතක් පිළිබඳවද එකවර අලෝකයක් අප තුළට පැමිණිය හැකිය. එය හොඳක් පිළිබඳ තියුණු අන්තර්දෘෂ්ටියක් අප තුළ කරන වෙනසට සාපේක්ෂව නරකකට වුව අප තුළ වෙනසක් ඇති කිරීමේ හැකියාවක් ඇත.

එහෙත් මෙහිදී එපිෆනි යන්නෙන් සාකච්ඡා කරන්නේ එකවර දර්ශනය වන, මිනිසා වෙනස් කිරීමේ ශක්‍යතාවෙන් හෙබි බුද්ධිමය අන්තර්දෘෂ්ටි පිළිබඳවයි. එලෙස යම් තියුණු විදර්ශනාත්මක ආලෝකයක් අප වෙනස් කිරීමට සමත් වූ විට නොයෙක් පුද්ගලයෝ විවිධාකාර අයුරින් එය ප්‍රකාශයට පත් කරති. ඇතැම් විට යමෙක් එය කෑගසා කියත්. තවකෙක් එය ලෝකය වෙනස් කරන න්‍යායක් ගොඩනගා ගැනීමට සංඥාවක් ලෙස සලකත්. එසේම තවකෙක් එය කවියකින්, කෙටි කතාවකින්, නවකතාවකින් හෝ සිනමා පටයකින් යන සාහිත්‍ය කලා නිර්මාණාදියෙන් ඉදිරිපත් කරත්. ඒ සියලු ප්‍රකාශනයන්ගෙන් ඉදිරිපත් වන්නේ අදාළ පුද්ගලයාගේ වෙනසට හේතු වූ ක්ෂණික අන්තර්දෘෂ්ටියේ ප්‍රකාශනයයි. සත්‍ය අවබෝධය වනාහිද බොහෝ කාලයන් මුළුල්ලේ ප්‍රගුණ කළ යමක් එකවර දර්ශනය වීමක්ය. එයද එපිෆනි යන්නෙහි එක් පැතිකඩකි. බුදුරජාණන් වහන්සේ විසින් 'අනේකජාති සංසාරං' (විමලකිත්ති හිමි සහ ජනානන්ද හිමි, 2006: 62,24) වැනි උදාන දේශනා කරන ලද්දේ එවැනි

ක්ෂණිකව දර්ශනය වූ බුද්ධිමය ප්‍රභාවක ප්‍රහර්ෂයෙනි. බුද්දක නිකායේ හමුවන උදාන හා ථේර, ථේරී ගාථා යන කෘතිවල සෞන්දර්යාත්මක හා ආගමික අගයෙන් යුත් කෙටි ගාථා ධර්ම හමු වේ. එම ගාථා ධර්මවල සංක්ෂිප්ත කර ඇත්තේ සත්‍ය අවබෝධයෙන් ලත් ප්‍රහර්ෂය භික්ෂු-භික්ෂුණීන් වහන්සේ ගාථාවක් ලෙස දේශනා කළ විධියයි. එයද එපිෆනි නොහොත් ක්ෂණික සත්‍ය දර්ශනය වීමේ (අන්තර්දෘෂ්ටියේ) ප්‍රතිඵලයකි. ඒ අනුව නූතන සිංහල කෙටිකවියේ පාඨකයා වෙනස් කිරීමට ශක්‍යතා ඇති ක්ෂණික අන්තර්දෘෂ්ටිමය ගුණාංග දක්නට ලැබෙන'යුරු මෙහිදී දීර්ඝව විමර්ශනය කෙරේ.

## 5.3. ක්ෂණික අන්තර්දෘෂ්ටි සංකල්පයේ ආංගික ලක්ෂණ හා නූතන සිංහල කෙටි කවිය

විසිවන සියවසට පෙර රෝමාන්තික කවියේදී එපිෆනි සංකල්පය මිනිසා හා සොබාදහම පිළිබඳ උත්තර, පාරිශුද්ධ, සදාතනික හැඟීම් හා වටිනාකම් දැනවීම සඳහා භාවිත වූ බව ඇමරිකානු දර්ශනික චාල්ස් ටේලර් පවසයි. ඔහු එය පැවැත්මේ ක්ෂණික අන්තර්දෘෂ්ටිය (epiphanies of being) යන නමින් හඳුන්වා ඇත (අමරකීර්ති, 2016: 196). එහෙත් විසිවන සියවසෙන් පසුව බිහිවන නූතනවාදී කවියෙහි එපිෆනි සංකල්පය වෙනස් අර්ථයකින් භාවිත විය. එනම් ස්වාභාවික වස්තු පිළිබඳ රෝමාන්තිකවාදී අදහස්වලින් වියුක්තව කිසියම් සංසිද්ධියක්, ප්‍රවාදයක් හෝ ස්වභාව දහමේ සිදුවීමක් ඇසුරෙන් පාඨකයාගේ අභ්‍යන්තරයට ක්ෂණික අන්තර්දෘෂ්ටිමය ආලෝකයක් දැනවීමයි.

නූතනවාදී කවියෙහි භාවිත එපිෆනි සංකල්පයෙහි ස්වභාවය ක්ෂණික අන්තර්දෘෂ්ටියක් හෙවත් ක්ෂණිකව යම් ප්‍රඥමය අලෝකයක් දර්ශනය වීමක්ය; සාහිත්‍ය නිර්මාණයක ප්‍රඥ-චමත්කාරයක් සහිත සෞන්දර්ය කාර්යයක් පිළිබඳ සංඥාවක් දැනවීමය. එපිෆනි (Epiphany) සංකල්පීය වචනය ක්ෂණික දර්ශනය, ක්ෂණික බුද්ධිමය ප්‍රභාව හා ක්ෂණික අන්තර්දෘෂ්ටිය යනුවෙන් සිංහලට පරිවර්තනය කළ හැකිය. මෙම සංකල්පය සාහිත්‍ය කියවීම් ක්‍රමයක් ලෙස භාවිත කිරීමේදී එහි ඇති ආංගික ලක්ෂණ පිළිබඳ අවබෝධය අත්‍යවශ්‍යය. අන්තර්දෘෂ්ටිය මගින් තර්ක බුද්ධියේ සීමා අතික්‍රමණය වන ලෙස කලාව හා සාහිත්‍යය භාවිත කරන්නේ කෙසේද යන්න කියාදෙයි (අමරකීර්ති, 2010: 67). එහිදී කිසියම් සාහිත්‍ය කලා ශානරයකින් ප්‍රකාශිත අන්තර්දෘෂ්ටියෙන් සැපයෙන ක්ෂණික බුද්ධිමය ප්‍රභාවෙන් රසිකයාට තර්ක බුද්ධියේ හා සමාජ සම්මත දෘෂ්ටිවාදවල සීමා ඉක්මවා සිතීමේ ක්ෂණික අවබෝධයක් සැපයේ. *Therigatha* (Poems of the First Buddhist Women) කෘතියේ එපිෆනි සංකල්පය පිළිබඳ ඉතා විශිෂ්ට පැහැදිලි කිරීමක යෙදෙන මහාචාර්ය චාල්ස් හැලිසි ක්ෂණික අන්තර්දෘෂ්ටියේ ආලෝකය මිනිසාට ලෝකය පිළිබඳ නිදහසේ සිතීමට ඉඩ ලබාදෙන බව පවසයි (Hallisey, 2015: ix).

මිනිසා උපතේ සිට දැනුවත්ව හෝ නොදැනුවත්ව විවිධ හෙජොමනි සංකල්ප හා නොයෙක් දෘෂ්ටිවාද පිහිටා හා ව්‍යූහගතව සමාජය දෙස බැලීමට පුරුදු වේ. එපිෆනියෙන් සිදුවන සත්‍ය ක්ෂණිකව දර්ශනය වීම හේතුවෙන් එලෙස ගොඩනගා ගත් පාරභෞතික හා ආචීර්ණ කල්පිත ආකල්ප විනිවිද යෑමේ ස්වාධීනතාවක් ගොඩනැගේ. එය කිසියම් සිදුවීමකින් හෝ සාහිත්‍ය කලා නිර්මාණයක් රසවිඳීමෙන් ගොඩනැගෙන විදර්ශනාත්මක අවබෝධයකි. යථාර්ථය, ලෝක සත්‍ය හා මනුෂ්‍යත්වය පිළිබඳ මානසිකව ගොඩනැගෙන එම විදර්ශනාත්මක ආලෝකය සාහිත්‍ය ඇසුරෙන් සොයා බැලීම ක්ෂණික අන්තර්දෘෂ්ටිය (Epiphany) නමැති සාහිත්‍ය න්‍යාය මගින් සිදු කෙරෙයි (සිරිසුධම්ම හිමි, 2019: 356).

එනම් අනුකරණවාදී සාහිත්යික, සංස්කෘතික, දේශපාලනික හා ආගමික ආධිපත්‍යයෙන් මිදී ප්‍රඥා-චමත්කාරයක් සහිත අන්තර් දෘෂ්ටියේ ආලෝක කණිකාවක් පාඨක අබිමුවෙහි තැබීම එපිෆනියෙන් සිදු වේ. එය සාහිත්‍ය නිර්මාණයක ඇතුළත් වන්නේ එකවර ඇස නොගැටෙන ලෙසින්ය. දක්ෂ පාඨකයා එවැනි අප්‍රකාශිත තැන් මනාව දකියි. පාඨකයා සත්‍ය කරා රැගෙන යන එකී අලෝක ධාරා හෙවත් අන්තර්දෘෂ්ටි මනාව හඳුනාගනී. සාහිත්‍යකරුවා ස්වකීය සමාජයට දනවන අන්තර්දෘෂ්ටි කවියේ මතුපිට සෝෂාකාරීබවට ආලෝලනය වන හදිසිකාර පාඨකයාට නොපෙනේ. සාහිත්‍ය නිර්මාණයෙන් ප්‍රකාශිත ක්ෂණික අන්තර්දෘෂ්ටියේ සත්‍යය දර්ශනය වීමට පාඨකයාද ඒ සඳහා පුරුදු පුහුණු විය යුතුය. එවැනි ක්ෂණික අන්තර්දෘෂ්ටියක අද්දැකීමක් පාඨකයාට හැඳුනාගැනීමට පහසුවන සේ එපිෆනියේ ලක්ෂණ කිහිපයක් පහත වෙන් වෙන්ව දක්වා ඇත. ඒවා උදාහරණ ආශ්‍රයෙන් පසුව වෙන් වෙන්ව සාකච්ඡා කෙරේ.

- ක්ෂණිකව දර්ශනය වීම
- ඇතුළාන්තයට කතා කිරීම සහ විනිවිද යාම
- අනිර්වචනීය හෝ අවාච්‍ය බුද්ධිමය අලෝකයක් මනසෙහි සැරිසැරීම
- සාම්ප්‍රදයික මතවලට ඉහළින් සිතීමට ඉඩ ලබාදීම
- තර්ක බුද්ධියේ සීමා අතික්‍රමණය
- ලෝකය දෙස ස්වාධීනව මෙන්ම විදර්ශනාත්මකව දැකීමට හැකිවීම
- සම්මත ආචාරධාර්මික සිරිත් විරිත්වලට සීමා නොවීම හා රෙගුලාසි ගත වැරදි දෘෂ්ටිවාද ඉවත් කිරීම
- හෙජමොනික (hegemony) සංකල්ප විනිවිද යමින් අධිපති මතවාද ප්‍රශ්න කිරීම
- එපිෆනිය එකවර ඇස නොගැටීම හා මතුපිට සාලංකාරික බවින් මිදීම
- දෛනිකත්වය ඇසුරෙන් වෙනස් ගැඹුරු අර්ථයක් මුණගැස්වීම
- කරණීය තර්කණයෙන් වියුක්තව ලෝකය දෙස දැකීමට ඉගැන්වීම
- කාලය, අවකාශ හා ක්‍රියාවලිය පිළිබඳ සංකථන පඨනය
- චිත්තරූප හා වචනවල අර්ථජනනීයතා එකිනෙකට සමීපව තැබීම

- අන්තර්දෘෂ්ටියේ ආලෝකයෙන් විවිධ අර්ථ ව්‍යූහ සංරචනය (අමරකීර්ති, 2010: 67-70), (Taylor, 2008: 460), (සිරිසුධම්ම හිමි, 2019: 356)

### 5.3.1.ක්ෂණිකව දර්ශනය වීම

ක්ෂණිකව දර්ශනය වීම හෙවත් දැනවීම එපිෆනියේ ස්වභාවයයි. සක්‍රීය හා උද්‍යෝගිමත් පාඨකයා කවිය සමග ගනුදෙනු කිරීමේදී එපිෆනි ක්‍රියාවලිය එකවර පාඨකයා වෙත සම්මුඛ වීම ස්වභාවයෙන්ම සිදු වන්නකි. කවියෙන් මතුවන බුද්ධිමය ප්‍රභාව පාඨක මනසේ සැරිසරන්නේ එකවර ඇසිපිය හෙළන ක්ෂණයකිනි. මෙහිදී 'එකවර දර්ශනය වීම' යන්න වරදවා වටහා නොගත යුතුය. මන්ද එපිෆනිය යන්න එකවර දර්ශනය වන්නේ පාඨකයාගේ පූර්ණ සවිඥ්ඥාණිකත්වය මතයි. පහත සඳහන් කෙටි කවිය ඇසුරෙන් එය තවදුරත් වටහාගත හැකිය.

"අලුත ගොඩබෑ<br>
මාළු අහිනෙහි<br>
වැඩිපුර ම උඩ පනින මාළුවා<br>
ඔහු<br>
මුහුදට ම බාර දෙයි" (රණවීර හා වීරසිංහ, 2014: 195)

මෙම කවියේ එපිෆනිය එකවර දර්ශනය වීමට නම් අදාළ පාඨකයා තර්ක බුද්ධියේ සීමා අතික්‍රමණය කරන, සම්මත සමාජ, සංස්කෘතික විඥ්ඥාණයට ඉහළින් සිතන පුද්ගලයෙකු විය යුතුය. මාළු වෙළෙන්දට සහ මස් වෙළෙන්දට සංවේදී, ළතෙත් හදවතක් නැති බව සමාජයෙහි සම්මත ආකල්පයයි. 'මාළුකාරයා', 'මස්කඩකාරයා' යැයි මිනිසුන් ඔවුන්ව හඳුන්වන්නේද කිසියම් අපහාසාත්මක දෘෂ්ටියකින් හා අධිකාරි බලයෙන් පහළ මට්ටමක තබමිනි. ඉහත කවිය මෙකී සම්මතයන්ට ඉහළින් සිතීමට අවශ්‍ය අන්තර්දෘෂ්ටිය පාඨකයාට ලබාදෙයි. එය එකවර දර්ශනය වී කියවන්නා වෙනස් කිරීමට සමත් අන්තර්දෘෂ්ටියක් ලෙස භාරගැනීමට පාඨකයාගේ චින්තන ක්‍රියාවලියේද යමක් තිබිය යුතු බව මෙමගින් පැහැදිලි වේ. මෙම කවිය සමාජයෙහි පවතින වැරදි දෘෂ්ටීන්ගෙන් නිදහස්ව එකිනෙකාට ගෞරව කිරීමට කියාදෙයි. ඒ සඳහා අවශ්‍ය විදර්ශනාත්මක ආලෝකය කවියා ලබා දෙන්නේ 'වැඩිපුරම උඩ පනින මාළුවා ඔහු මුහුදටම භාරදෙන බව' පැවසීමෙනි. එම යෙදුම සාම්ප්‍රදායිකව හා අධිපති මානසිකත්වයෙන් ගොඩ නැගුණු මනෝමූලික දෘෂ්ටිවාද බිඳ හෙලීමකි. රසිකයාට යථාර්ථය දැකගැනීමට මග එම අතුල් පහරෙන් කියාදෙයි. කවියක පවතින මෙවැනි සත්‍යයේ දර්ශනයන් අන්තර්දෘෂ්ටිය යනුවෙන් හැඳින්විය හැකිය. කෙටි කවිය වැනි කුඩා සාහිත්‍ය උපශානරවල අන්තර්දෘෂ්ටිය වැනි විශේෂතා අන්තර්ගත වීම එහි සෞන්දර්යය ශක්තිමත් වීමට හා ප්‍රඥාමය චමත්කාරයන්ගෙන් තීව්‍ර වීමට හේතුවකි.

### 5.3.2. ඇතුළාන්තයට කතා කිරීම සහ විනිවිද යාම

එපිෆනියකින් හෙවත් ක්ෂණික අන්තර්දෘෂ්ටියකින් සිදුවන ප්‍රධාන කාරණාවක් වන්නේ පාඨකාභ්‍යන්තරයට අමන්ත්‍රණය කිරීමයි. මිනිසා විසින් ගොඩනගාගෙන සිටිනු ලබන විවිධ සම්මත සීමා අන්තර්දෘෂ්ටිය මගින් අතික්‍රමණය කෙරෙයි. පාඨක අභ්‍යන්තරයට ක්ෂණික අන්තර්දෘෂ්ටියක් ආමන්ත්‍රණය කිරීමට සමත් වන්නේ කවියේ සමස්ත අංග කෙරෙහි පාඨකයා අන්තර්ගත වූ කල්හිය. අන්තරාවතීර්ණ වීම යනු විනිවිද යාමකි.

'විනිවිද යාම' යන පදයෙහි අර්ථය යමක් ඇතුළට අවතීර්ණ වීම යන්නයි. එනම් බාහිරින් හෝ මතුපිටින් බැලීම නොව එහි ඇතුළාන්තය නිරාකරණය කරගැනීමයි. යම් ගැටලුවක් හාත්පස විසඳා ගැනීමට ඒ ගැටලුව හා ඒකාත්මික විය යුතුය. ඒ ගැටලුව තුළම දිය විය යුතුය. එම අදහස වඩාත් නිවැරදිව එක් වචනයකින් පැවසිය හැක්කේ 'විනිවිද යාම' යන පදය මගින් බව මණ්ඩාවල පඤ්ඤවංස හිමියෝ පවසති (පඤ්ඤාවංස හිමි, 2015: 32,33). කිසියම් දෙයක් පිළිබඳ සැබෑ අවබෝධයක් ලැබීමට ඒ හා සමග එකතු වීම හෙවත් විනිවිද යා යුතුය. සාහිත්‍ය පඨිතයක ඇතුළාන්තය නිරවුල් කරගැනීමට සියලු අංග කෙරෙහි විනිවිද යා යුතුය. එලෙස කවියක් විනිවිද යන අවස්ථාවේ කවියේ අර්ථ ව්‍යූහ ලිහා බැලීමෙන් ප්‍රකාශ වන ක්ෂණික අන්තර්දෘෂ්ටිමය කණිකා පාඨකයාගේ ඇතුළාන්තයට කතාකරයි; ඔහුගේ ඇතුළාන්තය සමඟ ගනුදෙනු කරයි; ඔහුව වෙනස් කිරීමට සමත් වෙයි. පහත සඳහන් කෙටි කවිය ඒ සඳහා එක් උදාහරණයක් පමණි.

> "වැඩ ඇරී
> වැඩට යති
> ගැහැනු" (අතුකෝරල, 2008: 15)

බොහෝ විවාහ සංස්ථාවල ස්ත්‍රීන්ට පොදු වූ ජීවන චක්‍රය මෙම කවියේ වචන 5න් අර්ථවත් කෙරේ. පාඨක මනසෙහි ස්ත්‍රී සමාජභාවය පිළිබඳ සානුකම්පිත දෘෂ්ටියක් ඇති කරලීමට මෙම කවිය සමත්ය. පවුල් සංස්ථාව ඇතුළත ස්ත්‍රියගේ අපරිමිත කාර්යභාරය අගය කිරීම බොහෝ සැමියන්ට අමතක වන කාරණයකි. ගෙදර දෙර වැඩ හා දූදරුවන් බලාගැනීම ස්ත්‍රියට උරුම අනන්‍ය කාර්යයන් ලෙස සංස්කෘතිකගත වී ඇති අතර එය නිතර මිනිසා, සංස්කෘතිය හා සමාජ මගින් ප්‍රතිනිෂ්පාදනය වන දෘෂ්ටිවාදයකි. එකී සංස්කෘතික සම්මත හා ගෙදර වැඩ ස්ත්‍රියට පැවරීමේ මානසිකත්වයෙන් මිදීමට මෙම කවියෙන් ලැබෙන අන්තර්දෘෂ්ටිය ඉතා වැදගත්ය. මෙම කවිය තවදුරටත් පාඨකයාව ප්‍රබල අර්ථයක් කරා රැගෙන යයි. මෙම කවියේ සඳහන් වන්නේ වැඩ ඇරී වැඩට යන ස්ත්‍රියක පිළිබඳය. රැකියාවක් කළ පමණින් ස්ත්‍රියට උරුම වැඩවලින් ඇයට නිදහස් වීමට නොහැකි තරමට සමාජයේ ඇය උපකරණීය තත්ත්වයට පත්ව ඇත. ඇයට රැකියාවට අමතරව නිවසට ගිය පසුද නැවත වැඩ කිරීමට සිදු වේ. එබැවින් ස්ත්‍රීන් ජීවිත කාලය පුරාම සිදු කරන්නේ වැඩ ඇරී වැඩට යෑමේ ක්‍රියාවලියයි. මෙම කවිය වැඩ ඇරී ගෙදර ගොස් කිසිවක් නොකර

නිදහසේ සිටින ඇතැම් පිරිමින්ට නැවත තමන් ගැන් සිතීමට උගන්වන තියුණු අන්තර්දෘෂ්ටියක් සහිත කවියකි. තවද මෙම කවිය සංස්කෘතික මානයෙන්ද, ස්ත්‍රී දෘෂ්ටියෙන්ද, පිරිමි සමාජභාවයෙන්ද, සභානුකම්පිතවද, විසංයෝජනීයවද කියවිය හැකි බහුවිධ අර්ථ ඇතුළත් කෙටි කවියකි. කවියේ මෙම සියලු මානයන් මගින් ප්‍රකාශිත විවිධ ක්ෂණික අන්තර්දෘෂ්ටි සොයාගත හැක්කේ පාඨකයාට කවියේ සමස්තය විනිවිද යාමෙනි. මෙවැනි කවි මගින් ලබාදෙන ක්ෂණික අන්තර්දෘෂ්ටි පාඨකයාගේ චිත්තාභ්‍යන්තරයට ආමන්ත්‍රණය කිරීමට සමත් වන අයුරු ඉහත උදාහරණයෙන් පැහැදිලි වේ.

### 5.3.3.අනිර්වචනීය හෝ අවාච්‍ය බුද්ධිමය අලෝකයක් මනසෙහි සැරිසැරීම

කවියක් කියවීමේදී පාඨකයා වෙත සැපයෙන ක්ෂණික අන්තර්දෘෂ්ටිය කිසියම් අවාච්‍ය බුද්ධිමය උත්තේජනයකි. ඇතැම් විට එම හැඟීම භාෂාව පෙරළීමට අපොහොසත් හැඟීමක් වන අතර එය පුද්ගලබද්ධ කාරණාවක් වේ. කවියකින් සැපයෙන අන්තර්දෘෂ්ටිමය හැඟීමේ කිසියම් අවාච්‍යමය හා අනිර්වචනීය ස්වභාවයක් ගැබ්ව ඇත. සතුට, භය, වේදනාව ආදි හැඟීම් භාෂාවට නැගීම අපොහොසත් බැවින් ඒ ලක්ෂණය අන්තර්දෘෂ්ටියේ ආංගික ලක්ෂණයක් ලෙස හැඳින්විය හැකිය. කොවිඩ් වසංගත සමයක හෙට පිළිබඳ අවිනිශ්චිත හැඟීමකින් ජීවත් වන පාඨකයා, පහත කවිය කිවීමෙන් ලත් ක්ෂණික අන්තර්දෘෂ්ටියේ සමස්තය වචනයට හසු කර ගැනීමට පහසු නැත. එය අන්තර්දෘෂ්ටියේ ස්වභාවයයි.

"අවමගුල් පෙරහරේ
යන අතරතුර
ඔහු සකස් කරයි පා ඇඟිල්ලෙන්
සොහොන් බිම පඩිපෙළක
ගැලවුණු තැන්" (රණවීර හා වීරසිංහ, 2014: 28)

මෙම කෙටි කවියේ ඇතුළත් 'සොහොන් බිමක පඩිපෙළ' නමැති චිත්තරූපයෙන් ප්‍රකාශ වන්නේ තියුණු අන්තර්දෘෂ්ටියකි. ඉන් ජනිත වන හැඟීම අවාච්‍ය බුද්ධිමය ආලෝකයකි. ජීවිතය නමැති පඩිපෙළෙහි තැන් තැන් ගැලවී ගියද එය සංස්කරණය කිරීමට හැකි දෙයක් නොවේ. සමීප පුද්ගලයෙකුගේ මළගමක යන සැමවිටම මරණයේ ඇති අම්හිරි වේදනාව ප්‍රත්‍යක්ෂයෙන් අප සැම දන්නා කාරණාවකි. එහෙත් කොවිඩ් වැනි වසංගත සමයක මනුෂ්‍ය මරණ ගණන එදිනෙදා ඇස ගැටෙමින් සාමාන්‍යකරණයට ලක්ව ඇත. එවැනි අද්දැකීම් නිරන්තරයෙන් හමුවන කාලයක මෙවැනි කවිවලින් ලබා දෙන අන්තර්දෘෂ්ටි ජීවිතය හා මරණය පිළිබඳ යථාර්ථය පාඨකයාට සමීප කරවීමට සමත්ය.

### 5.3.4. සාම්ප්‍රදායික මතවලට ඉහළින් සිතීමට ඉඩ ලබාදීම

කිසියම් සාම්ප්‍රදායික මත මගින් කුමන හෝ පාර්ශ්වයකට අගතියක් වේ නම් එම මතවාද ප්‍රශ්න කිරීම බුද්ධිමත් පාඨකයාගේ ලක්ෂණයයි. ඇතැම් කෙටි කවිවලින් සපයන එපිෆනි එවැනි සාම්ප්‍රදායික මතවලට ඉහළින් සිතීමට අවශ්‍ය ක්ෂණික අන්තර්දෘෂ්ටි ලබාදීමට සමත්ය. පහත සඳහන් කෙටි කවිය ඒ සඳහා නිදර්ශන සපයයි.

"පිරිමි වීදුරු තුළ
පිරවෙයි
ගැහැනු වයින්" (ඇම්බ්‍රෝස්, 2018: 24)

ස්ත්‍රියගේ සියලු කරණීය පැවරුම්, ස්වභාවය, අගපසඟ, ඇඳුම් පැලඳුම් ආදි සියලු සංකල්ප සංස්කෘතික විඥ්ඤාණයට එකතු වී ඇත්තේ විවිධ ස්වරූපයෙනි. ඒ සඳහා අධිපතිවාදී පුරුෂ දෘෂ්ටියද බලපා ඇත. එබැවින් බොහෝ පිරිමි ආකෘතිවල ස්ත්‍රියට සිරවීමට සිදු වී තිබේ. මෙම කවියේ 'පිරිමි වීදුරු' හා 'ස්ත්‍රිය නමැති වයින් පිරවීම' තියුණු රූපක දෙකකි. එහි අන්තර්ගත අර්ථ ව්‍යූහ තියුණු අන්තර්දෘෂ්ටි පාඨකයා වෙත සපයන අතර සාම්ප්‍රදායිකව ස්ත්‍රිය පිළිබඳ නිගමනවලට එළඹ සිටින පිරිමි හා ගැහැනු දෙපාර්ශ්වයටම එම දෘෂ්ටිවාද විනිවිද යාමට මෙම කවිය කියාදෙයි.

### 5.3.5.තර්ක බුද්ධියේ සීමා අතික්‍රමණය කරයි

ක්ෂණික අන්තර්දෘෂ්ටිය සැමවිටම තර්ක බුද්ධියේ සීමා ඉක්මවා සිතීමට අවශ්‍ය මාන වෙත පාඨකයාව රැගෙන යයි. සමාජය විසින් ගොඩගනා ගෙන සිටින විවිධ තර්ක හා ප්‍රවාද කෙතරම් විශ්වාසයෙන් යුතුව සමාජ සම්මතයක් ලෙස ස්ථාවර වී තිබුණද එය සාවද්‍ය වන අවස්ථා තිබේදැයි සබුද්ධිමත් පාඨකයා සොයා බලයි. එපිෆනිය යනු ඒ සඳහා බුද්ධිය අවදි කරන ආලෝක විධියකි. සමාජ, සංස්කෘතික හා ආගමික ව්‍යූහ මගින් මිනිසා වෙත පවරන ලද තර්ක බුද්ධියේ සීමා අතික්‍රමණය කරන අන්තර්දෘෂ්ටියක් පහත සඳහන් ආරියවංශ රණවීරගේ කවියෙන් දැකගත හැකිය.

"**අම්මා**
අම්මා දකින්න ආසයි හීනෙන් වත්
තාත්තමයි එන්නේ මහ උදාරමින්
මුල්ලේ ද ඔබ ළිප ගිනි මැද ඔහේදිත්
හීනයත් අත්පත් කරගෙන ද තාත්තා......?" (රණවීර, 2017: 28)

සාමාන්‍ය සමාජයේ පවතින පුරුෂවාදී අධිපති මතවාද පවුල් සංස්ථාවේ මව්පිය ධුරාවලීයේද දැකගත හැකිය. 'අම්මා' හා 'තාත්තා' යන ප්‍රතිපක්ෂ යුගලයේ පාරභෞතික බලය සහිත පදය 'තාත්තා' යන පදයයි. පාඨකයාට මෙම තර්කය ඉතා සියුම්ව විග්‍රහ කිරීමට අවශ්‍ය

තියුණු අන්තර්දෘෂ්ටියක් ඉහත කවියෙන් සැපයේ. මෙම කවියේ සඳහන් 'හීනෙන් වත් අම්මා දකින්නට නොහැකි වීමත්', 'තාත්තා මහ උදාරමින් පෙනීමත්', 'අම්මා ළිප ගිනි මැද මුල්ලට වී සිටීමත්', 'තාත්තා හීනය අත්පත් කරගෙන සිටීමත් යනු වෙන වෙනම කියවිය හැකි අර්ථ ව්‍යූහ සහිත පද හතරකි. පුරුෂමූලික සමාජ රටාවක ජීවත් වන ස්ත්‍රියකගේ ඉරණම 'මුල්ලේ ද' යන වචනයෙන් මනාව පාඨකයාට ඒත්තු ගැන්වෙයි. තවද අම්මා හීනෙන් වත් දැකීමට අවශ්‍ය වුවත් හීනෙන් වුව තාත්තා පෙනීම මගින් සමාජ, සංස්කෘතික හා පුද්ගල විඥ්ඤාණයට අධිපති දෘෂ්ටිවාද කර ඇති බලපෑම වටහාගත හැකිය.

### 5.3.6.ලෝකය දෙස ස්වාධීනව මෙන්ම විදර්ශනාත්මකව දැකීමට හැකිවීම

ලෝක ස්වභාවය පිළිබඳ වඩාත් නිදහස්ව දැකීමට පුද්ගල මනස දියුණු කිරීම පහසු කාර්යයක් නොවේ. මිනිසාට ලෝකය දෘශ්‍යමාන වන්නේ ඔවුන්ගේ දෘෂ්ටියේ ස්වභාවය අනුවය. එවැනි පරිසරයක මිනිසා විසින් ගොඩනගා ගන්නා ආස්ථානවල පවතින ස්වාධීනතාවේ නිරවද්‍යතාව මැන ගැනීමට අන්තර්දෘෂ්ටි ඉවහල් වේ. මෙහිදී කෙටි කවිවල පවතින එම ගුණාංගය පහත කවියෙන් තවදුරටත් පැහැදිලි කරගත හැකිය.

"පුංචිම
කුහුඹුවාටත්
අඳුරු
සෙවණැල්ලක්" (නිවුන්හැල්ල, 2009: 20)

වසන්ත ප්‍රියංකර නිවුන්හැල්ලගේ ඉහත කවියෙන් ලබා දෙන ක්ෂණික අන්තර්දෘෂ්ටියේ විදර්ශනාත්මක ආලෝකය ඉතා ස්වාධීනව ලෝකය දෙස බැලීමට කියාදෙයි. අනෙකාට ගරු කිරීම හා අනෙකාගේ ස්වාධීනතාව ආරක්ෂා කිරීම මෙම කවියෙන් ලබාදෙන ප්‍රබල දාර්ශනික අන්තර්දෘෂ්ටියයි. මෙහි සෙවණැල්ල යනු බහුවිධ අර්ථ ජනනීය ශක්‍යතාවෙන් යුක්ත රූපකයකි. සමාජය විසින් පුද්ගලයාගේ ස්වභාවය හෝ වෙනත් සත්වයෙකුගේ ප්‍රමාණය මත සෙවණැල්ලේ වටිනාකම තීරණය කළද මෙම කෙටි කවිය සියලු පූර්ව නිශ්චිත නිගමන බැහැර කර සියලු සත්වයන්ගේ වටිනාකම සමාන බව පාඨකයාට කියාදෙයි.

### 5.3.7.සම්මත ආචාරධාර්මික සිරිත් විරිත්වලට සීමා නොවීම හා රෙගුලාසි ගත වැරදි දෘෂ්ටිවාද ඉවත් කිරීම

සම්මත ආචාරධාර්මික සිරිත් විරිත් එලෙසම පිළිගැනීමට සීමා නොවී ඒ සියලු රෙගුලාසිගත පිළිගැනීම් විචාරාත්මකව දැකීම හා ප්‍රශ්න කිරීමට පොහෝනා අන්තර්දෘෂ්ටි ඇතැම් කෙටි කවි මගින් පාඨකයා වෙත සපයා ඇත. පාඨකයාගේ විචාරාත්මක චින්තනය අවදි කරවන සුලු ක්ෂණික අන්තර්දෘෂ්ටි ඇතුළත් අගනා කෙටි කවි කිහිපයක් කුසල් ධනංජය කුරුවිටගේ 'අස්පර්ශනීයන් වෙත' කාව්‍ය කෘතියේ දැකගත හැකිය.

"හාම්පුතු ත්‍යාගශීලී බවත්
කසල ශෝධක
මංකොල්ලකාරයකු බවත්
කුණු බක්කියක් සිතයි" (කුරුවිට, 2020: 33)

සමාජය දෙස ආචාරධාර්මිකව බැලීමට අවශ්‍ය සම්මත හා නිර්මිත හුදෙක් දේවභාෂිතයක් හෝ වෙනස් කළ නොහැකි දෙයක් ලෙස නොසිතීමට අවශ්‍ය විචාරාත්මක දෘෂ්ටිය මෙම කවියෙන් පාඨකයාට ලබාදෙන අන්තර්දෘෂ්ටියයි. මෙහි 'කුණු බක්කිය' යන යෙදුම ක්ෂණික අන්තර්දෘෂ්ටියක් සපයන අර්ථ ව්‍යූහයකි. මිනිසා විසින් අදහනු ලබන හානිදායක විවිධ දෘෂ්ටිවාද 'කුණු බක්කිය' හා සමානය. කවියා පාඨකයාට ස්වකීය ඇතුළාන්තය දෙස නිරීක්ෂණයට ඉඩකඩ ලබා දෙන්නේ 'කුණු බක්කිය' නමැති අන්තර්දෘෂ්ටි ආලෝකයෙනි. ත්‍යාගශීලී හා ත්‍යාගශීලී නොවන පිරිස් අප වෙන් කර ඇත්තේ ධනවත් හා නිර්ධන ස්තරායනය යටතේය. එහෙත් ත්‍යාගශීලී යැයි සම්මත හාම්පුතුන් මංකොල්ලකරුවන් නොවන්නේද යන ප්‍රශ්නාර්ථයේ අන්තර්දෘෂ්ටිය මෙම කවිය විචාරාත්මකව කියවන පාඨකයාට අනවරතව සිහිකැඳවේ.

### 5.3.8. හෙජමොනික (hegemony) සංකල්ප විනිවිද යමින් අධිපති මතවාද ප්‍රශ්න කිරීම

හෙජමොනිය හෙවත් නායකාධිපත්‍යය ප්‍රශ්න කිරීම හා බලය සහිත සංකල්ප හා භාෂාත්මක අසමබර තැන් නිදහස්ව කියවීම එපිෆනියකින් පාඨකයාට ලැබෙන තවත් බුද්ධිමය ආලෝකයකි. හෙජමොනිය **(hegemony)** යන්න අන්තෝනියෝ ග්‍රැම්ස්චි විසින් විස්තර කරන ලද න්‍යායික සංකල්පයකි. හෙජමොනි යන වචනය එක් අයුරකින් ධනපති පන්තිය සෙසු පන්තිවල කීකරුබව ලබාගන්නා ක්‍රමෝපයක් ලෙස අර්ථ ගැන්විය හැකිය (දිසානායක, 2010: 197). සමාජයේ බලය හිමි පාර්ශ්වය විසින් තම බලය තහවුරු කරගැනීමටත් පවත්වාගෙන යාමටත් ජන විඥ්ඥාණය හැසිරවීමටත් විවිධ හෙජමොනි නිර්මාණය කරනු ලබයි. එය විවිධ ක්‍රම ඇසුරෙන් සමාජගත වේ. සිරිත් විරිත්, ආගමික විශ්වාස, සංස්කෘතිය, දේශපාලනය හා භාෂාව ආදි විවිධ අංශ මගින් නිර්මාණය වන හෙජමොනිය විසින් මිනිසා පාලනය කරනු ලබයි. එය මර්දනීය උපකරණ ලෙසින් හා දෘෂ්ටිවාදාත්මක උපකරණ වෙසින් මිනිසා වෙත පැමිණෙයි. එලෙස මිනිසා පාලනය වන අධිකාරි මත විනිවිද යන ක්ෂණික අන්තර්දෘෂ්ටි යම් යම් කෙටි කවිවල දැකගත හැකිය.

"හාම්පුතු රථය පදවන'තර
කියන වචනයක් පාසා
හිස වනයි
අර සෙල්ලම් බල්ලා" (කුරුවිට, 2020: 89)

හෙජමොනි සංකල්ප නොහොත් විවිධ අධිපති මතවාද ජන විඥ්ඥාණයට හුරුපුරුදු වූ කල්හි මිනිසාව එම මතවාද විසින් පාලනය කෙරෙන බව ඔවුන්ටම නොතේරෙයි. එවිට එම මතවාද පවත්වාගෙන යනු ලබන්නේ පාලනය කරන පිරිස විසින් නොව පීඩිත පන්තිය විසින්මය. එය අප නොදැනුවත්වම අප විසින් ප්‍රතිනිෂ්පාදනය කරනු ලබයි. ඉහත කෙටි කවියේ සඳහන් 'සෙල්ලම් බල්ලා' යනු උක්ත කියමන වඩාත් පැහැදිලි කරන සංකේතයයි. සෙල්ලම් බල්ලා යනු හාම්පුතුගේ කැමැත්ත-නොකැමැත්ත අනුව හැසිරීම තීරණය කරන ප්‍රාණය නිරුද්ධ සත්වයෙකි. විවිධ හෙජමොනි සංකල්ප මගින් පාලනය වන අප හුදෙක් ප්‍රාණය නිරුද්ධ සෙල්ලම් බල්ලන් නොවේද යන්න මෙම කවියෙන් සැපයෙන එක් ක්ෂණික අන්තර් දෘෂ්ටියකි.

### 5.3.9. එපිෆනිය එකවර ඇස නොගැටීම හා මතුපිට සාලංකාරික බවින් මිදීම

ඇතැම් කෙටි කවිවල දක්නට ලැබෙන අන්තර්දෘෂ්ටි එකවර ඇස නොගැටේ. කවියා එම අන්තර්දෘෂ්ටිය සපයන්නේ නිර්මාණයේ මතුපිට සාලංකාරික නිමගනවලට එකවර ඇස නොගැටෙන ලෙසිනි. ගැඹුරු කියවීමකින් විනිර්මුක්ත හදිසිකාර සහෘදයෙකුට කවියේ වාඩ්මය තලයේ දක්නට නොලැබෙන එහෙත් නිර්වාඞ්මය තලයේ පිහිටවන ලද අර්ථව්‍යුහ සංගෘහීත එකී අන්තර්දෘෂ්ටිමය එළි ග්‍රහණය කරගත නොහැකිය. ඒ සඳහා නිර්මාණයේ සංඥා හා බැඳි සන්දර්භගත ව්‍යුහ හා ඉන් පිටත ව්‍යුහ හඳුනා ගැනීමට පාඨකයාට සිදු වේ. තවද කවියේ නිර්වාඞ්මය සංඥා ඇති කරන ද්විතීයක අර්ථ සලකා බැලීමට පාඨකයා සංවේදී විය යුතුය. මෙම කරුණු රෝලන්ඩ් බාත් විසින් පෙන්වා දෙන ලද්දේ ව්‍යුහවාදී සංකල්පද ඉක්මවා යමිනි. එනම් කෘතියක් කතුවර දෘෂ්ටියෙන් (writerly) හා පාඨක දෘෂ්ටියෙන් (readerly) කියවීමට යෝජනා කිරීමයි (රණවීර, 2019: 244). එවිට නිර්මාණයේ මතුපිට එකවර නොපෙනෙන බොහෝ නිර්වාඞ්මය තල පාඨකයාට සොයාගනු හැකි වේ. පහත සඳහන් කවියේ අන්තර්දෘෂ්ටි කවියේ මතුපිය පෘෂ්ඨයේ එකවර දෘශ්‍යමාන නොවේ. පාඨකයාට එය වටහා ගැනීම පිණිස කවියේ නිර්වාඞ්මය තලවලට පිවිසීමට සිදු වේ.

"පර්වතය මත විතරක් ද
මේ තණපත මතත්
හිරු එළිය" (රණවීර හා වීරසිංහ, 2014: 27)

මෙම කවියේ මතුපිට මහා ඝෝෂාකාරීව අර්ථ විවෘතතාවක් නොමැත. පාඨකයාට අර්ථය වටහාගැනීම පිණිස නිහඬ, නිශ්චල නිර්වාඞ්මය අර්ථ ව්‍යුහ ලිහා බැලීමට සිදු වේ. මෙම කවිය නාගාර්ජුනපාදයන්ගේ ශූන්‍යතා දර්ශනයේ අන්‍යෝන්‍ය ප්‍රතිබද්ධතාව (Interdependence relationship) සිහි කැඳවයි. එනම් ශූන්‍යතාව වනාහිම හුදෙක් යමකට තනිව පැවතිය නොහැකි බවයි. එහිදී හිරු, පර්වත, තණ පත් යනු හුදෙකලා වස්තුවක් නොවේ. ඒ සියල්ල අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතී. එම සත්‍ය වටහා ගැනීමට තමන්

සමීපයේ ඇති තණපත වුව ප්‍රමාණවත්ය. යමෙකුට තණපත හා අන්තරාවතීර්ණ වීමෙන් හිරුද, පර්වතයද එක සේ දැකිය හැකිය. එවිට එම වස්තූන් දෙකෙහි වෙනසක් ඔහුට නොපෙනේ. (එකම වස්තුවක් ලෙස පෙනීමෙන් අර්ථවත් වන්නේ ඕනෑම වස්තුවක සමාන පදාර්ථ අන්තර්ගත වී ඇති සත්‍ය වටහා ගැනීමයි.) එබැවින් ඇතුළු හදෙහි ආධ්‍යාත්මික සුව සොයන යෝගියාට තමන් සමීපයේ ඇති ඉතා කුඩා දෙයකින් මහා විශාල යථාර්ථයක් දැකිය හැකිය. මෙම කවියෙන් ප්‍රතීත වන්නේ පාඨක ආධ්‍යාත්මය හා සන්නිවේදනය වන ක්ෂණික අන්තර්දෘෂ්ටියකි. එය පාඨකයාගේ ඇතුළු හදෙහි විදර්ශනාත්මක ප්‍රහර්ෂ දනවන්නකි. මෙම කවියෙන් ජනිත වන එකී එපිෆනිය ඉහත අනුමාතෘකාවල සාකච්ඡා කළ කෙටි කවිවල අන්තර්දෘෂ්ටිවලට වඩා සපුරා වෙනස්ය. එබැවින් කෙටි කවියේ ප්‍රස්තුතය අනුව ඉන් ජනිත වන අන්තර්දෘෂ්ටිය විවිධ ස්වරූප ගන්නා බව පාඨකයා දත යුතුය.

### 5.3.10. දෛනිකත්වය ඇසුරෙන් වෙනස් ගැඹුරු අර්ථයක් මුණගැස්වීම

සාමාන්‍ය මනුෂ්‍ය ජීවිතයේ සිදුවන දෛනිකත්වයේ ප්‍රකාශන ඇසුරෙන් වෙනස් ගැඹුරු අරුත් නිෂ්පාදනය කවියේ එක් කාර්යභාරයකි (අමරකීර්ති, 2016: 217). එහිදී කවියාට දෛනිකත්වයට ඉහළින් අර්ථ නිෂ්පාදනය කිරීමද දෛනිකත්වය තුළින්ම අරුත් නිපදවීමද සිදු කළ හැකිය. එලෙස නිර්මාණයෙන් ප්‍රකාශිත දෛනිකත්වය විනිවිද යන අන්තර්දෘෂ්ටියක් පහත කෙටි කවියෙන් පාඨකයාට සැපයේ.

"නිදහසේ
ගෙට එන්න
ගේට්ටුවේ එල්ලා
කන්තෝරුව" (කපුවත්ත, 2015: 42)

මාලන් බණ්ඩාර කපුවත්ත රචනා කළ **අඟුණ මල්** නමැති කෙටි කාව්‍ය සංග්‍රහයේ ඇතුළත් ඉහත කවියද ප්‍රබල අන්තර්දෘෂ්ටියක් සපයන කවියකි. රාජකාරි ජීවිතය හා පෞද්ගලික ජීවිතය පටලවාගත් පවුල් ජීවිත අද සමාජයේ කොතෙකුත් අපට හමුවේ. කන්තෝරුව ගේට්ටුවේ එල්ලා ගෙට පැමිණෙන ලෙස ආරාධනා කිරීමෙන් පාඨකයාට ලබාදෙන ප්‍රබල අන්තර්දෘෂ්ටිය කෙටි කවිය වචන අවම වූ පමණින් බැහැර කළ නොහැකි කාව්‍ය උපශානරයක් බව වටහා දීමට සමත්ය. මෙම කෙටි කවිය මගින් එදිනෙදා ජීවිතයේ හමුවන දෛනිකත්ව මගින් යථාර්ථය ප්‍රතිනිර්මාණය කිරීම සිදු කෙරේ. එහිදී කවියා එදිනෙදා ජීවිතයේ යථාර්ථය පාඨකයා අභිමුව තබන්නේ අලුත් අද්දැකීමක ස්වරූපයෙනි. කන්තෝරුව ගේට්ටුවේ එල්ලීම යන කාව්‍යෝක්තියෙන් ගොඩනැගෙන තියුණු එළිය මිනිසා කෙතරම් කන්තෝරුවල එල්ලා සහ එල්ලී සිටින්නේද යන්න ප්‍රශ්න කෙරෙයි. පාඨකයාගේ අභ්‍යන්තරයේ ගොඩනැගෙන එවැනි ප්‍රශ්න කවියෙන් ගොඩනැගුණු අන්තර්දෘෂ්ටියේ ප්‍රතිඵලයයි.

### 5.3.11. කරණීය තර්කණයෙන් වියුක්තව ලෝකය දෙස දැකීමට ඉගැන්වීම

කෙටි කවිවලින් සැපයෙන ක්ෂණික අන්තර්දෘෂ්ටි තර්ක බුද්ධියේ සීමා අතික්‍රමණය කරන බව ඉහත මතෘකාවකදී සාකච්ඡා කෙරිණි. එලෙස තර්ක බුද්ධියේ සීමා ඉවතලන තවත් එක් දැක්මක් ලෙස කරණීය තර්කණයෙන් වියුක්තව ලෝකය දෙස බැලීම හැඳින්විය හැකිය. නූතන සමාජයේ ජීවත් වන මිනිසා විවිධ සම්මතයන්ගේ කරණීය භූමිකාවක එක් කොටස්කරුවෙකි. එහිදී කරණීය තර්කණය (instrumental reason) යනුවෙන් අදහස් වන්නේ උපකරණවාදී මානසිකත්වයයි. එම කරණීය භූමිකා සමාජ සම්මත ලෙස ජන විඥ්ඥාණයට ඇතුළු වී ඇත. උදාහණයක් ලෙස බිරිඳ පිළිබඳ මනුෂ්‍යත්වයෙන් නොව උපකරණවාදී මානසිකත්වයෙන් බැලීමට බොහෝ මිනිසුන් පුරුදු වී තිබේ (අමරකීර්ති, 2010: 67). ඊට හේතුව බිරිඳ වනාහි උදෑසන නැගිටීම, දරුවන් බලාගැනීම, කෑම පිළියෙල කිරීම, රෙදි සේදීම ආදි කරණීය භූමිකා ඇයට නියමිත කාර්යයන් ලෙස සම්මත වී ඇති බැවිනි. මෙවැනි කරණීය තර්කණ විචාරාත්මක දෘෂ්ටියෙන් දැකීමට පාඨකයා පොළඹවන එපිෆනි ඇතැම් කෙටි කවිවල දැකිය හැකිය.

"**නිදහස් අධ්‍යාපනය**
සාමා අමර
කෝ සල් මල් සුවඳ
පිපෙන්නට පෙර
උන් කඩාගෙන...
හෙට ඒවි යන්න
ගහත් කපා ගෙන
හිටපං ඇහැරිලා
සල්ගහ බදාගෙන" (ඥාණානන්ද හිමි, 2014: 29)

විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් හා බැඳි කරණීය තර්කණයක් ලෙස නිදහස් අධ්‍යාපනය රැකගැනීම සමාජගත වී තිබේ. බොහෝ විශ්වවිද්‍යාල උද්ඝෝෂණවල දක්නට ලැබෙන සටන් පාඨයක් ලෙස නිදහස් අධ්‍යාපනය සුරැකීම දැකගත හැකිය. එහෙත් නිදහස් අධ්‍යාපනය සුරැකීම හුදෙක් විශ්වවිද්‍යාල ශිෂ්‍යයාගේ කරණීය භූමිකාවේ කොටසක් පමණක් නොවේ. එය ඉන් පරිබාහිර මිනිසුන්ගේද අපේක්ෂාවක් විය යුතුය. මීට අමතරව පාඨකයාට කරණීය තර්කණයෙන් වියුක්තව ලෝකය දෙස බැලීමට සියුම් එහෙත් තියුණු අන්තර්දෘෂ්ටියක් පහත සඳහන් කෙටි කවියෙන් සැපයේ.

"කන්දකට පුළුවන් නම්
දියවෙන්න
මුහුදකට බැරි ඇයි

ගිනිගන්න" (ෆර්නැන්ඩු, 2019: 70)

මෙම කවියේ නිර්ව්‍යාඩමය අර්ථ ව්‍යුහ කිහිපයක කරණීය තර්කණ කිහිපයක් ඉක්මවා ඇති අයුරු ඉතා සියුම් නිරීක්ෂණයෙන් වටහාගත හැකිය. ස්ත්‍රිය පිළිබඳ සම්මත විනිවිද කියවීම මුහුදක් තරම් 'දරා ගැනීම' යන සාමන්‍ය තර්කණය ඉක්මවා 'ගිනි ගැනීම' යන නවමු කාව්‍යෝක්තියෙන් අඟවා ඇත.

### 5.3.12. කාලය, අවකාශ හා ක්‍රියාවලිය පිළිබඳ සංකථන පඨනය

කෙනෙත් යසුඩා The Japanese Haiku නම් කෘතියෙහි හයිකු කවියක පාදවල ඇතුළත් අවස්ථා තුනක සම්මුතියක් දකියි. එය හයිකු කවියෙහි අන්තර්ගතය හා හයිකු තාක්ෂණය වටහාගැනීමට පහසු න්‍යායාත්මක ලක්ෂණයකි. එය සියලු හයිකු කවිවල එක සේ දැකගත නොහැකි ගුණාංගයක් නොවුණත් කෙටි කාව්‍ය උපශානරවල ස්වභාවය වටහා ගැනීමට මෙම ත්‍රිවිධ ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය වැදගත්ය. එසේම යම් යම් කෙටි කවිවලින් සැපයෙන අන්තර්දෘෂ්ටි වටහාගැනීමටද මෙම කාලය අවකාශය හා ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යාසය වැදගත්ය. කෙනෙත් යසුඩා පවසන හයිකු කවියේ මූලික පදර්ථ තුන පහත දැක්වේ (Yasuda, 1985: 41).

- අවකාශය පිළිබඳ ඥනනය (Sense of Place) - කොහේද (Where)
- ක්‍රියාව පිළිබඳ ඥනනය (Sense of Action) - කුමක්ද (What)
- කාලය පිළිබඳ ඥනනය (Sense of Time) - කවර වේලාවකද (When)

"'රෑ වුණා'
කියාගෙන
ගෙට ඇදෙමි
කපට බැව්
හන්දාම.

ඈ සිනහ මුව
තවම
හැන්දෑව" (වෙඩිවර්ධන, 2020: 65)

මංජුල වෙඩිවර්ධන විසින් රචිත මෙම කෙටි කවියේ 'රෑ වීම හා හැන්දෑව' යන ස්ථානවල ඇත්තේ 'කාලය' යන පදාර්ථයයි. 'ගෙට ඇතුළු වීම' යනු 'අවකාශයයි'. 'ඈ සිනා මුව' තවම පැවතීමත් 'කපටි භාවයත්' ක්‍රියා යන පදාර්ථයයි. යසූඩා පවසන ත්‍රිවිධ ක්‍රියාවලිය මෙම කවියේ බොහෝ නිර්ව්‍යාඩමය අර්ථ ව්‍යුහ වටහාගැනීමට අත්වැලකි. මුළු දවසම තනි ගෙදරක

ජීවත් වන බිරිඳකගේ චිත්තාභ්‍යන්තරයේ හැසිරීමත් බිරිඳගෙන් වෙන්ව රැකියාවට පිටව ගොස් නැවත පැමිණෙන ස්වාමියාගේ හෘදසාක්ෂියත් එකිනෙකට සම්මුඛ වන අවස්ථාවක් ලෙස 'ඈ සිනාහ මුව තවම හැන්දෑව' යන ප්‍රකාශනයෙන් දැනවේ. ස්වාමි-භාර්යා සම්බන්ධතාව පිළිබඳ ඉතා තියුණු අන්තර්දෘෂ්ටියක් විවෘත අවකාශයක තබන කවියා නිහඬ වන්නේ පාඨකයාට එය විසඳා ගැනීමට අවස්ථාව ලබා දෙමිනි.

### 5.3.13. චිත්තරූප හා වචනවල අර්ථජනනීයතා එකිනෙකට සමීපව තැබීම

කෙටි කවියක සෞන්දර්ය පාඨකයාට සම්මුඛ කරන ප්‍රධාන ලක්ෂණයක් ලෙස චිත්තරූපය හැඳින්විය හැකිය. ඒ සඳහා ඇතැම්හු සංකල්ප රූප යන වචනය භාවිත කරති. කෙටි කවියේ දක්නට ලැබෙන සීමිත වචන සංඛ්‍යාවක බොහෝ අර්ථ හෝ අලංකාර එකතු කළ නොහැකිය. දක්ෂ කෙටි කවියා ඒ සඳහා භාවිත කරන කාව්‍ය උපක්‍රමය වන්නේ චිත්තරූපික හා රූපකාර්ථ භාෂා භාවිතයයි. ඇතැම් කෙටි කවිවල වචනවලින් අපේක්ෂිත අර්ථජනනීයතාවත් ඒ හා බැඳි චිත්තරූප සංකලනයත් ක්ෂණික අන්තර්දෘෂ්ටි පාඨකයා වෙත සැපයෙන තවත් මාර්ගයකි. එහිදී සිදු වන්නේ කවියේ වචනවල අර්ථයත් චිත්තරූපයත් එකවිට පාඨකයාට මුණගැස්වීමයි.

> "බොහෝ කලකට පසු
> වැ කන්ද බැස එන මට
> යමක් කියන්නට ගිය
> පැරණි කෝන්ගහ
> ම'දෙස බලා නිහඬ විය" (විජේසිරිවර්ධන, 2017: 79)

'පැරණි කෝන්ගහ' යනු කවියේ සමස්තය කේන්ද්‍රගත වන ස්ථානයයි. පාඨකයා කවියේ චිත්තරූපයත් බහුවිධ අර්ථජනනීයතාවත් සමීපාර්ථයේ තබා විසඳන්නේ 'කෝන්ගහ' යන සංකේතය ස්වකීය අද්දැකීම් හා අනුයුක්ත කිරීමෙනි. මෙහි කෝන්ගහ රූපකාර්ථවත් යෙදුමකි. කවියා කෝන්ගහ යන සංකේතයෙන් ජීවිතයේ විඳි සියලු අතීත අද්දැකීම්වල විශාලත්වයත් නිහඬව දරා සිටීමත් ඉස්මතු කරයි. කෝන්ගහ ම'දෙස බලා නිහඬ වීම යන්නෙන් පාඨකයා වෙත තියුණු ක්ෂණික අන්තර්දෘෂ්ටියක් සැපයේ. ඕනෑම ජීවිතක සම්පූර්ණයෙන් විවෘත නොකරන ලද හා විවෘත කළ නොහැකි සිදුවීම් දරා සිටීම මානව ජීවිතයේම එක් සංකීර්ණ ක්‍රියාවලියකි. ඒ කෝන්ගහේ නිහඬත්වයේ දෝංකාරය පාඨකයාට ස්වකීය අභ්‍යන්තරයෙන් ඇසීම මෙම කවියෙන් සැපයෙන අන්තර්දෘෂ්ටියේ එක් පාර්ශ්වයකි.

### 5.3.14. අන්තර්දෘෂ්ටියේ ආලෝකයෙන් විවිධ අර්ථ ව්‍යූහ සංරචනය

ක්ෂණික අන්තර්දෘෂ්ටියක් බහුශාබ්දික විය හැකිය. එනම් බොහෝ ශබ්ද හා අර්ථ ගොඩනැගීමට ඇති හැකියාවයි. කවියක් කියවීමෙන් එකවර පැමිණෙන බුද්ධිමය අවදි වීමක්

මගින් පාඨකයාගේ අභ්‍යන්තරයෙහි ඇතුළු එළියක් නිර්මාණය විය හැකිය. එය ආධ්‍යාත්මික සහනයක් විය හැකිය. ඇතැම් විට සම්මත ඓතිහාසික, දේශපාලනික සන්දර්භවලින් ඈත්ව සර්වකාලීන මානවවාදී හා දාර්ශනික අර්ථවලට සමීප වීමට අන්තර්දෘෂ්ටිය මගපාදනු ඇත. කවියේ වස්තුවිෂය අනුව හා පාඨකයාගේ කියවීමේ ස්වභාවය අනුව අන්තර්දෘෂ්ටි මගින් විවිධ අර්ථ ව්‍යූහ සංරචනා කරනු ලබයි. කවිය නිගමනාත්මක බවින් නිදහස්ව විවෘතව තැබෙන විට පාඨකයා එමගින් විවිධ සංරචනා සිදු කරගනී. එය පාඨකයාගේ අද්දැකීම් හා කියවීමේ ධාරිතාව අනුව පාඨකයාගෙන් පාඨකයාට වෙනස් වේ. (රෝලන් බාත් පශ්චාත් ව්‍යූහවාදය යටතේ පැහැදිලි කරන පාඨක ප්‍රතිචාර න්‍යාය ඇසුරෙන් මෙම කාරණාව වඩාත් ගැඹුරෙන් සාකච්ඡා කළ හැකිය.) කවියෙන් ඉස්මතු වන අන්තර්දෘෂ්ටියේ ආලෝකයෙන් විවිධ අර්ථ ව්‍යූහ සංරචනය වන අයුරු පහත උදාහරණයෙන් පැහැදිලි කරගත හැකිය.

> "හඳත්
> ලපයක්
> හදා ගත්තනෙ" (සේනාරත්නන, 2015: 18)

පාලිත සේනාරත්න විසින් රචිත මෙම කෙටි කවියේ අන්තර්දෘෂ්ටිය විවිධාර්ථවත් සංරචනයකට පාඨකයාව පොළඹවයි. කවියා පවිත්‍රත්වය, ආදරය, සුන්දරත්වය ආදි විවිධ අර්ථ දැනවීමට 'සඳ' භාවිත කර තිබේ. කවීන් ඒ තරමට සඳෙහි ඇති ලප හා කැළැල් පිළිබඳවද විවිධ කාව්‍ය රචනා ලියා තිබේ. එහෙත් මෙම කෙටි කවියේදී කවියා සිදු කර ඇත්තේ එම සංසිද්ධිය නැවත ප්‍රතිනිෂ්පාදනය කිරීම නොවේ. කවියා විසින් මෙහිදී සිදු කරනු ලබන්නේ සාමාන්‍ය සමාජයේ පවතින ප්‍රවාදයක් ප්‍රතිනිෂ්පාදන ස්වරූපයෙන් බහු අර්ථ ජනනට සමත් සංරචනයක් ලෙස ප්‍රතිනිර්මාණය කිරීමයි. එහිදී 'සඳ' හා 'ලපය' යන සංකේතාර්ථ චිත්තරූපද්වය රූපකාර්ථයෙන් කියවීමට පාඨකයා සමත් විය යුතුය. එවිට 'සඳ' හා 'ලපය' යන්නට විවිධාර්ථ ආරෝපණය කරගත හැකිය. හුදෙක් කැළැල් දැක සිනාසෙන අයටත් දුක් වෙන අයටත් කැළැල් වනාහි සුන්දරත්වයේම ආංගික ලක්ෂණයක් බව මෙම කවියෙන් ලබාදෙන තියුණු හා ක්ෂණික අන්තර්දෘෂ්ටියයි.

## 6. සමාලෝචනය

කෙටි කවි යනු නූතන සිංහල කාව්‍ය ප්‍රවණතාවල හමුවන නවතම කාව්‍ය උපශානරයකි. එහෙත් මෙම කාව්‍ය උපශානරයේ ඇති සුවිශේෂතා වර්තමානයේ අධ්‍යයනය වී ඇත්තේ අවම වශයෙනි. කෙටි කවියේ ඇති වචන අවම බව හා රිද්මයානුකූල බවින් තොරවීම යන හේතු කරණකොට ගෙන මෙම කාව්‍ය උපශානරය සම්බන්ධයෙන් ඇතැම්හු විවිධ දෝෂාරෝපණ එල්ල කරති. මෙම පර්යේෂණයේදී කෙටි කවිවල ඇති විශේෂතාව එපිෆනි (Epiphany) සංකල්පය හෙවත් ක්ෂණික අන්තර්දෘෂ්ටිය නමැති න්‍යායාත්මක ප්‍රවේශය

යටතේ සාකච්ඡා කළ අතර එහිදී කෙටි කවිවලින් ලැබෙන ක්ෂණික බුද්ධිමය ආලෝකයේ ප්‍රබලත්වය කෙසේදැයි වටහාගැනීමට හැකිවිය. ඒ අනුව කෙටි කවි හුදෙක් එකවර කියවා ඉවතලිය නොහැකි පුද්ගලයාගේ ඇතුළාන්තයට ක්ෂණිකව ආමන්ත්‍රණය කළ හැකි විශිෂ්ට අන්තර්දෘෂ්ටිමය කණිකා ගුණාංග ඇතුළත් කාව්‍ය ශානරයක් බව සනාථ විය. මෙම එපිෆනි ගුණාංගය සියලු කෙටි කවිවල එකසේ දැකගත නොහැකිය. එය කෙටි කවියේ අර්ථයට හා සෞන්දර්යයට සමීප විය හැකි එක් න්‍යායික ප්‍රවේශයක් පමණි. එමෙන්ම එපිෆනි ගුණාංගය කෙටි කවි සඳහා පමණක් අනන්‍ය කියවීම් ක්‍රමයක් නොවේ. එය ඕනෑම සාහිත්‍ය, කලා නිර්මාණයක් කියවීමේදී භාවිත කළ හැකිය. ක්ෂණික අන්තර්දෘෂ්ටියේ හෙවත් එෆිපනියේ විවිධ ස්වභාව තිබිය හැකිය. එය වස්තුවිෂය අනුව පාඨකයාගේ ස්වභාවය හා බුද්ධිමය ධාරිතාව අනුව පෙනෙන හා දැනෙන අයුරු වෙනස් විය හැකිය. එබැවින් කෙටි කවියේ භාවිත ප්‍රස්තුතය අනුව ඉන් ජනිත වන අන්තර්දෘෂ්ටිය විවිධ ස්වරූප ගන්නා බව පාඨකයා දත යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අතුකෝරල, ලක්ශාන්ත. (2008). හිතග්ගිස්සෙ නැතත් මොට්ටු. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

අමරකීර්ති, ලියනගේ. (2016). නව කවි සලකුණ. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

අමරකීර්ති, ලියනගේ. (2010). පහන සහ කැඩපත. බොරැල්ල: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

බණ්ඩාර කපුවත්ත, (2015). මාලන්. අඟුණ මල්. කර්තෘ ප්‍රකාශනයකි.

කල්පනී, ඇම්බ්‍රෝස්. (2018). පියා නොහැඹූ පියාපත්. නුගේගොඩ: සංහිඳ ප්‍රකාශකයෝ.

කුරුවිට, කුසල් ධනංජය. (2020). අස්පර්ශනීයන් වෙත. යක්කල: සන්ථව ප්‍රකාශන.

ගම්ලත්, සුචරිත. (සංස්.). (2009). ඉංගිරිසි-සිංහල මහා ශබ්දකෝෂය. නුගේගොඩ: සංහිඳ ප්‍රකාශකයෝ.

තැන්නේ ඤාණානන්ද හිමි. (2014). පන්හිඳක දඟ. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, විමල්. (2010). නව විචාර සංකල්ප. බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ.

පඤ්ඤාවංස හිමි, මණ්ඩාවල. (පරි.). (2015). Y+kH;djdoh o idfmalaI;djdoh o@. කොළඹ: සේරි ප්‍රකාශන.

ප්‍රියංකර නිවුන්හැල්ල, වසන්ත. (2009). iq<Õ. අනුරාධපුරය: වන්නි ප්‍රකාශන.

රණවීර, ආරියවංශ. (2017). තවමත් මල්. මහරගම: අහස මීඩියා වර්ක්ස්.

රණවීර, ආරියවංශ සහ නන්දන වීරසිංහ. (2014). තුන් පෙති හතර පස් පෙති. කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

රණවීර, ආරියවංශ. (2019). බටහිර සාහිත්‍ය විචාර විධි. මහරගම: අහස මීඩියා වර්ක්ස්.

විජේසිරිවර්ධන, සුනිල්. (2017). ගිරි මුදුන මගේ නිවහන. දෙහිවල: විදර්ශන ප්‍රකාශන.

විමලකිත්ති හිමි, අහුන්ගල්ලේ සහ උඩුවේ ජනානන්ද හිමි. (පරි.). (2006). Oïumomd<s ^iq;;msgfl Lqoaol ksldfhd 1 ^ÿ;sh .fJ:d&&. (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව). නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

වෙඩිවර්ධන, මංජුල. (2020). නිමිති. දෙහිවල: විදර්ශන ප්‍රකාශන.

සිරිසුධම්ම හිමි, අපරැක්කේ. (2019). කෙටි කවි ලකුණ. යක්කල: සන්ථව ප්‍රකාශන.

සේනාරත්න, පාලිත. (2015). හයිකු මොහොත. කර්තෘ ප්‍රකාශනයකි.

ෆර්නැන්ඩු, යේශා. (2019). ලිලැක්. නුගේගොඩ: ඉමාෂි ප්‍රකාශන.

Bowen, Zack. (1981). Joyce and the Epiphany Concept: *A New Approach, Journal of Modern Literature*. Volume 09 (Issue 01), Indiana University Press.

Hallisey, Charles. (trans.). (2015). *Therigatha (Poems of the First Buddhist Women&).* Cambridge: Harvard University Press.

Paranavitana, S. (1945). "Brahmi Inscriptions in Sinhalese Verse," *Journal of the Ceylon Branch of the Royal Asiatic Society*. (Vol. xxxiv, No 98) Ceylon Branch.

Taylor, Charles, (2008). *Sources of the Self the Making of Modern Identity*. Cambridge: Cambridge University Press.

Yasuda, Kenneth. (1985). *The Japanese Haiku*. Tokyo: Charles E. Tuttle Company.